ලි.ප.තැ.

මගේ අංකය - DNBG/F.15/Pro/2023-36
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය,
2023 මැයි මස 10වන දින

**සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සඳහා ජල පොම්පයක් ලබාගැනීම**

පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සඳහා ජල පොම්පයක් මිලදී ගැනීම සඳහා සීල් තැබූ ලංසුපත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ. පිරිවිතර සහ මිල ගණන් ආකෘති පත්‍රය මේ සමඟ අමුණා ඇත. . ලංසු ලියවිලි www.botanicgarden.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන්ද භාගත කර ගත හැක.

02.අදාල පිරිවිතර වලින් යුත් ඔබගේ ලංසු පත් 2023.05.23 වැනි දින පෙ.ව11.00ටපෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් පහත ලිපිනයට යොමු කරන්න. (ලංසුපත් 2023.05.23 දින පෙ.ව 11.00 ට විවෘත කරනු ලැබේ.)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ජාතික උද්භිද උද්‍යානය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 14,
පේරාදෙණිය.

03.ලංසුපත් මෙම දෙපාර්තම්න්තු කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි කාමරයේ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටිය වෙත අතින් ගෙනවිත් බහාලීමටද පහසුකම් සලසා ඇත. සෑම ලංසුපතක්ම බහාලන කවරයේ වම්පස ඉහල කෙලවර "DNBG/F.15/Pro/2023- "සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සඳහා ජල පොම්පයක් මිලදී ගැනීම" යනුවෙන් සඳහන් කරන්න. ලංසුපත් ඉහත දින නියමිත වේලාවට විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් නම් කරනු ලබන නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැක. ඉදිරිපත් කරනු ලබන ලංසු පත් සම්පූර්ණයෙන්ම හෝ ඉන් අඩක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති සතුවන බවද සළකන්න. මේ සම්බන්ධයෙන් වැඩිමනක් තොරතුරු අවශ්‍ය වන්නේ නම් අංක 0812388654 අංකයෙන් ප්‍රධාන ගණකාධිකාරි ඇමතීමෙන් ලබාගත හැකිය.

**පහත සඳහන් කරුණු පිළිබඳ සැළකිලිමත් වන්න.**

(1) . ඒ ඒ පිරිවිතරයන්ට අදාලව සියලු තොරතුරු ඇතුලත් මිල ගණන් පත් එවිය යුතුය.
(2). ලංසු ආකෘති පත්‍රයේ මුළු සැපයුම සඳහා වන වටිනාකම සඳහන් කල යුතුය.
(3). මිල ගණන් ඉදිරිපත් කිරීම සම්බන්ධව තවත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් ආයතනයේ ලිපි ශීර්ෂයෙන් අත්සන, නිලමුද්‍රාව හා දිනය ඇතුලත් ලිපියක් මඟින් ඉදිරිපත් කළ හැක.
(4) ලංසුපත් සමඟ අනෙකුත් තොරතුරු ඉදිරිපත් කිරිමේදි ඔබගේ ලියාපදිංචි අංකය ඇතුලත් ලිපි ශිර්ෂ වල පමණක් එවිය යුතු අතර, ඉලක්කම් වෙනස් කරන්නේ නම් ඒ ස්ථාන වල කෙටි අත්සන් යෙදිය යුතුය.
(5). ටිපෙක්ස් භාවිතය ඉදුරාම තහනමිය.
(6). ලංසු ආකෘති පත්‍රයේ මිල ගණන් අකුරින් හා ඉලක්කමෙන් සඳහන් කර ආයතනයේ නිල මුද්‍රාව තබා අත්සන් කළ යුතුය.
(7). මෙයට පෙර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා සැපයුම් ලබාදි ඇත්නම් එම තොරතුරු සනාථ කිරීමට අදාල තොරතුරු හා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. (ආසන්න වශයෙන් වසර 02 ක ආයතන 02 ක් සඳහා සිදුකර ඇති සැපයීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්වේ.)
(8). දේශිය ආදායම් කොමසාරිස් විසින් මෙතෙක් පනවා ඇති හා ඉදිරියට පනවනු ලබන සියලුම බදු මුදල් වලට ඔබ යටත් වන බව සලකන්න.
(9) පහසුවෙන් අමතර කොටස් ලබාගැනීමේ හැකියාවක් තිබිය හැකි වීම සහ අවශ්‍ය අවස්ථාවලදී අළුත්වැඩියා කිරීමේ හැකියාවක් පැවතීම
(10). මිල ගණන් බහා එවන කවර වල විවෘත කල හැකි ස්ථාන සීල් තබා නිල මුද්‍රාව තබා එවීමට කටයුතු කරන්න.

(11). මෙහි ප්‍රසම්පාදනයෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන් පිළිගැනීම අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සතු වන්නේය.

(12). ලංසුපත් බහාලන කවරයේ වම්පස පහළ කෙලවරේ ලංසුකරුගේ නම හා ලිපිනය සඳහන් කිරීම අනිවාර්යය වේ.

(13). සියලු භාණ්ඩ සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, ඉළුක්ඕවිට, තුම්මෝදර යන ලිපිනයට ප්‍රවාහණය කර සැපයිය යුතුය.

(14) නියෝජිත බලපත්‍රය හා නිෂ්පාදන බලපත්‍රය (Manufacture Authority) ඇමිණිය යුතුය.

වි.ජී.සී නදීශා ගමගේ
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

# සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය සඳහා ජල පොම්පයක් මිලදී ගැනීම -**මිලගණන් පත්‍රය**

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍යය | ප්‍රමාණය | පිරිවිතරය | වැට් රහිත වටිනාකම රු. | වැට් මුදල රු. | වැට් සහිත වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| 1 | ජල පොම්ප | 01 | අශ්ව බල (HP) - 10/12.5 (අවම)<br><br>උපරිම උස (MAX HEAD)- 225,290(අවම)<br><br>පිටකිරීම (OUTPUT)- 2000LPH (අවම)<br><br>විදුලි බලය(POWER)- තෙකලා 3 Ph (අවම)<br><br>වර්ගය -Veritical<br><br>No of Stage – 08 nos (අවම) | | | |

**වගකීම් කාලය ..........................................................................................**
**(සහතිකය ඇමිණිය යුතුය)**

**අලෙවියෙන් පසු සේවාව සම්බන්ධව සඳහන් කරන්න**

**.....................................................................................................................................**
**.....................................................................................................................................**
**.....................................................................................................................................**
**...........................................................................................................................**

**මුළු මුදල (අකුරෙන්) රු ....................................................**

**ඉහත මිල ගණන් යටතේ සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, ඉළුක්ඕවිට, තුම්මෝදර වෙත ප්‍රවාහනය කර සැපයීමට එකඟ වෙමි.**

**.......................................................** **..............................**

**ලංසුකරුගේ අත්සන හා නිලමුද්‍රාව** **දිනය**